# සිසිල් ගුණසේකරගේ ''රැළිය'' 1000 දැක්ම



රැල්ල, පුදුමලම්පුව, ගුවන් කරණම්, උකුස්ස, වෙඩිමුර, වඩමාරච්චි, දෙහිවල හන්දිය, හොල්ට්, රැල්ලෙන් රැල්ලට, ගුවන් කුරුල්ලෝ ඉතාලියේ කතාවක් (ඉතාලි ජාතික කාලෝ ගොල්ඩොනිගේ 'වන් සර්වන්ට් ඇන්ඩ් ටූ මාස්ටර්ස්' ඇසුරෙන් ලියවුණු පරිවර්තනයක්) එළිය (එංගලන්ත ජාතික ජෝ වර්ඔන්ගේ 'වට් ද බට්ලර් ෂෝ' ඇසුරෙන් ලියවුන 'එළිය' දකුණු අප්‍රිකාණු හිටපු ජනාධිපති නෙල්සන් මැන්ඩෙලාගේ ජීවිත කතාව ඇසුරෙන් ලියවුණු ''මැන්ඩෙලා මැන්ඩෙලා'' සහ ''රැළිය'' යන නාට්‍ය නිෂ්පාදනය කළ සිසිල් ගුණසේකර ගේ නාට්‍ය ශ්‍රී ලංකාව පුරා දර්ශණ දහස් ගණනක් වේදිකා ගත කර ඇත.

25 වසරකට කිට්ටු කාලයක නාට්‍ය ක්ෂෙත්‍රයේ අත්දැකීම් සිසිල් ගේ වඩාත්ම ජනප්‍රිය වූ නාට්‍යයන් අතර 'රැල්ල, ගුවන් කරණම්, රැළිය' යන නාට්‍ය ත්‍රිත්වය සනිටුහන් කල හැක. ශ්‍රී ලංකාවේ දැනට ජනප්‍රියත්වයේ සිටින නළු නිළියන් රැසක් කලා ලොවට බිහිකර ඇති ඔහු නාට්‍ය ක්ෂෙත්‍රයේ වාර්තා රැසක් ද තබා ඇත. ටෙනිසන් කුරේ ''ගුවන් කරණම්'' නාට්‍යයෙන්ද, ඩිලානි අබේවර්ධන ''උකුස්සා'' නාට්‍යයෙන්ද, රොෂාන් පිලපිටිය ඔහුගෙන් බිහි වූ නළු නිලියන් අතර සඳහන් කල හැක.

1997 මැද භාගයේ මරදාන එල්පින්ස්ටන් රඟහලේදී ''රැළිය'' නාට්‍යයේ මංගල දර්ශණය අති උත්කර්ශවත් අන්දමින් වේදිකා ගතවිය. එදා අති විශාල ජනකායක් රඟහල වෙත ගලා ආ බැවින් දර්ශණ දෙකකට සිමා වූ ''රැළිය'' අතිරේක දර්ශණයක් පැවැත්වූ අතර ඉන් ද ජනතාව වැඩි වූ නිසා පසුදිනද අතිරේක දර්ශණ වේදිකා ගත කිරීමට සංවිධායකයින්ට සිදුවිය. එසේ ලංකාවේ අස්සක් මුල්ලක් නෑර වේදිකා ගත වූ ''රැළිය'' නැරඹීමට නගරයේ මෙන්ම ගම් නියම් ගම්වල ප්‍රේක්ෂකයෝද සැදි පැහැදි සිටිහ. දින 02 නොකඩවා ශ්‍රී ලංකාව පුරා ''රැළිය'' වේදිකා ගත කරමින් තැබූ වාර්තාවක්, එමෙන්ම වැඩිම ආදායම් වාර්තා තැබූ නාට්‍යයක් ලෙස ''රැළිය'' සඳහන් කළ හැක.

මහරගම යොවුන් රඟහල - මරදාන එල්ෆින්ස්ටන් රඟහල, මහනුවර කටුගස්තොට ශාන්ත අන්තොනි රඟහල, කිරිබත්ගොඩ ශගඑගජ්ග්ග ශාලාවට ගලා ආ අති විශාල ජනතාව හැසිරවීමට පොලිස් නිලධාරීන්ගේ වූ මෙහෙය සඳහන් කලද, ජනතාවගේ තදබදය නිසා රඟහල්වලට වූ අලාභහානි අති විශාල විය. ඒ හේතුවෙන් මහරගම යොවුන් රඟහල සිසිල් ගුණසේකරගේ ''රැළිය'' ට සහ ඔහුගේ කිසිම නිර්මාණයන් සඳහා ලබා නොදීමට බලධාරීන් තීරණය කලහ. අනිත් රඟහලවල් ''රැළිය'' ට පමණක් අය කරන ගාස්තුව තෙගුණ කරමින් රඟහල ගාස්තු ඉහල නැන්විය. එදා වේදිකා නාට්‍යය ප්‍රවේශ පත්‍රයක් සඳහා වූ අවම මිල රු. 20/- වූ අතර උපරිම මිල රු. 100/- විය. අවම මිල රු. 100 සිට උපරිමය රු. 1000/- දක්වා මිල නියම වී ''රැළිය'' තැබූ ඒ වාර්තාව ද මෙතෙක් බිඳ දැමීම කිසිම වේදිකා නාට්‍යයකට නොහැකි විය. රැළිය වේදිකාගත කිරීමට දින ගණනකට පෙර ප්‍රේක්ෂකයෝ ප්‍රවේශපත් වෙන්කර ගැනීමද කැපී පෙනුනි.

රැළිය නැවතත් 2006 ඔක්තෝබර් 27 වන දින රාත්‍රී 8.00 සිඩ්නි හි බ්ලැක් ටවුන් බොවන් රඟහලේදී වේදිකා ගත වේ. සුදු රත්නාප්පුලි. විමලින්ද්‍ර, කුමාරි, ශාන්ත වනිගතුංග, සම්පත් ජයවීර, සාවින්දා, මාවලගේ, ශ්‍රියා රණසිංහ, සිසිර අස්වැද්දුම, තිලක් රණසිංහ, එරන්ද ජයරාජ්, ලක්ෂමන් විතාන, රුවන් විරකෝන්, ජිවන්ති වික්‍රමරත්න, අරියපාල මඩපාතගේ, විශ්ව පිරිස්, උපෙන්ද්‍ර සිල්වා, දිපානි ගුණතුංග සමග පාලිත ගුණසේකර රංගණ දායකත්වයෙන්ද, නිමල් වනිගසිංහ වෙෂ නිරූපණයෙන්ද කටයුතු කරයි.

## බුවනෙක ගේ හීන්සැරය



මාමෙ.. අයිඩිල් කියන්නෙ මොකක්ද මාමෙ?

උඹත් අහන්නෙ මාර ප්‍රශ්ණනෙ බෑනො.. ඕකට එක එක විදිහෙ අර්ථ කතන දෙන්න පුලුවන්.. දැන් බලපන් ලංකාවෙ .. අයිඩිල් හින්දා ලංකාවෙ සංගීතයට වෙලා තියෙන දේ..

ඇයි මොකක්ද වෙලා තියෙන්නෙ..?

උඹ බබා.. උඹ දන්නේම නැහැ.. තමන්ගෙ තුට්ටු දෙක වියදම් කරලා එස් එම් එස් ගහලා කොම්පැණි පෝසත් වුනා.. කේලො කොල්ලො පිස්සු වැටුනා. වෛරය වැපිරුවා.. කුහක කම වැපිරුවා.

අම්මද බොල මාරයිනෙ. මං දන්නෑනෙ එහෙම එකක්.. හැබැයි මාමෙ අයිඩිල් කියන්නෙ ඒක නෙවෙයි.. මගේ නිර්වචනය මේකයි.. අයි ඩල්.. මම ඩල් වෙලා ඉන්නකොට කීයක් හරි හොයා ගන්න ක්‍රමයක්..



ශ්‍රීපාලි එදිරිසිංහ
**සුදුතාරකා**



සෙව්වන්දිකා අබේරත්න
**නෙතඟ නිලුපුල්**



මිහිඳු මාපා
**කිඳුරු කොදෙව්වේ**



ලලිත් අරුණශාන්ත
**තනිතරුව/ ඉස්පිලි පාපිලි/ විසිරිලා සිත**


මේ ගී තැටි දැන් සූරිය වෙතින් තැපෑලෙන් ලබාගන්න මිල ඩොලර් 10. තැපැල් ගාස්තු අපෙන්

Sooriya marketing Services
22 Lorne Street
Lalor Vic 3075
Tel 03 9402 5380


## කෑමට පසු

අක්ද්ක්දතොරොස් ලියයි

